# හිඳගල රජමහා විහාරයේ පවතින අගයන් පිළිබඳ අධ්‍යයනයක්

ආර්.එම්.කේ.එම්. රත්නායක[1], එස්.පී.එන්.එස්. කීර්තිරත්න[2], ඒ.පී.එම්.සී. ඇතුගල[3]

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හිඳගල රජමහා විහාරය පිහිටා ඇත. මෙම විහාරය වළගම්බා රජ දවස ගොඩනැගූ බව බොහෝ දෙනාගේ මතයයි. ලිඛිත මූලාශ්‍රයවල ඇති ඓතිහාසික අගයන් ද ක්ෂේත්‍රයේ පවතින පුරාවිද්‍යාත්මක සාධක පාදක කරගෙන ඒ තුළින් පුරාවිද්‍යාත්මක හා කලාත්මක වටිනාකම් හඳුනාගැනීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වන අතර ක්ෂේත්‍ර මෙන්ම ක්ෂේත්‍ර නොවන අධ්‍යයන මේ සඳහා යොදාගැනේ. මෙම විහාරය අතීතයේ "වටක වහර" හා "ඉන්ද්‍රසාල ගුහාව" නමින් ද හඳුන්වා ඇත. හිඳගල රජමහා විහාරය අදවන විට ප්‍රචලිතව ඇත්තේ එහි ඇති බිතුසිතුවම් නිසාවෙනි. මෙම සිතුවම්වලට ලංකා ඉතිහාසයේ වැදගත් තැනක් හිමිව ඇත. ක්‍රි.ව. 7 වැනි සියවස, ක්‍රි.ව. 14-18 සියවස් , හා 20 වැනි සියවසේ මුල් අවධිවලට අයත් සිතුවම් මෙහි දක්නට ලැබේ. විහාරයේ ලෙන් පියස්සට ඉහළින් සිතුවම් දෙකක් දක්නට ලැබෙන අතර එහි වම්පස සිතුවමින් මිනිස් රූපවලට සාපේක්ෂව වඩා වැඩි ප්‍රමාණයකින් යුතු බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් රාජායතන නුග රුක මුල වැඩ සිටින ආකාරයත් පෙන්නුම් කෙරේ. දකුණු පස සිතුවමින් ඉන්ද්‍රසාල ගුහාවේදී සක්දෙවිඳුන් බුදුහිමියන් දැකීමට පැමිණෙන ආකාරය සිතුවම් කර ඇත. මකර තොරණකින් බුද්ධ මන්දිරයට පිවිසීමට ඇති අතර එහි තව්තිසා භවන, බ්‍රහ්මණයන් දෙදෙනෙක්, ඉන්ද්‍ර හා මහා බ්‍රහ්ම දේවතා රූප, දොරටුපාල රූප හා ලියවැල් දක්නට ලැබේ. බුද්ධ මන්දිරය තුළ සැතපෙන බුදු පිළිමයන්, හිඳි පිළිමයන් හා හිටි පිළිම පිහිටා තිබේ. මන්දිරයේ ඇතුළත බිත්තියේ සහ පිටත බිත්තියේ ඇති සිතුවම් තුළින් බුද්ධ චරිතයේ විවිධ අවස්ථා නිරූපනය වේ. ඒ අතරින් ඇතුළත බිත්තියේ සිතුවම් නුවර හා ගම්පොළ යුගයට අයත් වේ. අද වනවිට පැරණිතම සිතුවම් බොහෝ සෙයින් විනාශයට පත්ව ඇත. මෙම රජමහා විහාරයේ ක්‍රි.ව. 6, 7 වැනි ශත වර්ෂයට අයත් සෙල්ලිපි දෙකක් ද දක්නට ලැබෙන අතර සෙනරත් පරණවිතාන විසින් ඒවා අධ්‍යයනයට ලක්කර ඇත. වර්ෂ 1815 දී කොත්මලේ විහාරයක සිට ශ්‍රී දළදා මාළිගයට දළදා වහන්සේ වැඩම කරවන අතරතුර දළදා වහන්සේ එක් රැයක් හිඳගල රජමහා විහාරයේ තැම්පත් කර තිබුණි. මෙම සියලු කරුණුවලින් පිළිබිඹු වන්නේ පුරාවිද්‍යාත්මක, කලාත්මක ඓතිහාසික යන වටිනාකම් හිඳගල රජමහා විහාරයට උරුම බවය.

**ප්‍රමුඛ පද :** විහාරය, සිතුවම්, පිළිම, පුරාවිද්‍යාත්මක , හිඳගල

---

[1 3] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. koshimadushani14@gmail.com

[2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. nkeerthirathne95@gmail.com